31. (1) (අ) පොලිස්පතිවරයා හෝ පොලිස්පතිවරයා විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද නියෝජ්‍ය පොලිස්පති ධුරයට නොඅඩු ධුරයක් දරන යම් නිලධරයකු විසින් ආරක්ෂක අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත තත් කාර්යය සඳහා ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මගින් (2) වන උප වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් කාර්යයක් සඳහා සැකකරුවෙකු රඳවා තැබීම පිණිස රඳවා තැබීමේ නියමයක් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය. රඳවා තැබීමේ නියම

(ආ) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසු, සැකකරු විසින් මේ පනත යටතේ වන වරදක් සිදු කරනු ලැබ ඇති බවට හෝ වරදක් කිරීමට සම්බන්ධ වී ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින බවට ආරක්ෂක අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සෑහීමට පත්වන්නේ නම්, ඔහු විසින් එකී හේතු වාර්තාගත කිරීමෙන් පසු, අනුමත රඳවා තැබීමේ ස්ථානයක, අනුමත රඳවා තබාගැනීමේ කොන්දේසි යටතේ සැකකරු රඳවා තැබීමට බලය ලබා දෙමින් හතරවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූලව රඳවා තැබීමේ නියමයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(ඇ) මේ වගන්තිය යටතේ වන රඳවා තැබීමේ නියමයක් පළමුව මාස දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන රඳවා තැබීමේ නියමයක, එය නිකුත් කිරීම සඳහා වූ හේතු ඇතුළත් විය යුතු අතර, හුදෙක්ම පහත දැක්වෙන කාර්ය සඳහා අවශ්‍ය වන විට දී පමණක් නිකුත් කරනු ලැබිය යුතු ය:-

(අ) සැකකරුට අදාළ විමර්ශන පැවැත්වීමට පහසුකම් සැලසීම සඳහා ;

(ආ) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීමට අදාළ විමර්ශනය සඳහා තොරතුරු සහ ලබා ගත හැකි සාක්ෂි ලබා ගැනීම සඳහා;

(ඇ) රඳවා තබා සිටින සැකකරුගෙන් ප්‍රශ්න කිරීම සඳහා ; සහ

(අ) යම් නිශ්චිතව දක්වනු ලබන ප්‍රදේශයකට හෝ පරිශ්‍රයකට ඇතුළු නොවන ලෙස;

(ආ) නිශ්චිතව දක්වනු ලබන ප්‍රදේශයකින් හෝ පරිශ්‍රයකින් පිටවන ලෙස;

(ඇ) නිශ්චිතව දක්වනු ලබන ප්‍රදේශයකින් හෝ පරිශ්‍රයකින් පිට නොවන ලෙස සහ එකී ප්‍රදේශය හෝ පරිශ්‍රය තුළ රැඳී සිටින ලෙස;

(ඈ) යම් මාර්ගයක ගමන් නොකරන ලෙස;

(ඉ) කිසිවක් ප්‍රවාහනය නොකරන ලෙස හෝ කිසිවකුට ප්‍රවාහන සැපයීම නොකරන ලෙස;

(ඊ) නිශ්චිතව දක්වනු ලබන පොදු ප්‍රවාහන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලෙස;

(උ) යම් ස්ථානයකින් විශේෂ වස්තුවක්, වාහනයක්, යාත්‍රාවක් හෝ ගුවන් යානයක් ඉවත් කරන ලෙස;

(ඌ) වාහනයක්, යාත්‍රාවක්, නැවක් හෝ ගුවන් යානයක් එහි වර්තමාන පිහිටීමෙහි ම තැබීම අවශ්‍ය ලෙස;

(එ) වැඩිදුර දැනුම් දීමක් නිකුත් කරනු ලබන තෙක් යාත්‍රාවක් හෝ නැවක් යම් නිශ්චිතව දක්වනු ලබන ප්‍රදේශයක් තුළට යාත්‍රා නොකරන ලෙස;

(ඒ) ගුවන් යානයක්, නිශ්චිතව දක්වනු ලබන ගුවන් අවකාශයක් තුළට හෝ ඉන් පිටත හෝ පියාසර නොකරන ලෙස;

(ඔ) යම් විශේෂ ස්ථානයක ඒකරාශී නොවන ලෙස;

(ඕ) විශේෂ රැස්වීමක්, රැලියක් හෝ පෙළපාලියක් නොපවත්වන ලෙස; සහ

(ක) යම් නිශ්චිතව දක්වනු ලබන ක්‍රියාකාරකමක නිරත නොවන ලෙස:

එසේ වුව ද, (අ) ඡේදයේ සිට (ක) ඡේදය දක්වා වන ඡේද යටතේ වන කිසිදු විධානයක්, මහේස්ත්‍රාත්වරයකුගේ පූර්ව අනුමතය ලබා නොගෙන නිකුත් කරනු නොලැබිය යුතු අතර, ඒ මහේස්ත්‍රාත්වරයා විසින් ඒ විධානය නිකුත් කිරීමට පෙරාතුව ඒ විධානය නිකුත් කිරීමට ඇති අවශ්‍යතාවය පිළිබඳ සෑහීමට පත් වී

නඩු කටයුතුවල දී එකී ප්‍රකාශය එකී තැනැත්තාට එරෙහිව සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කර ගත යුතු ය.

(4) මේ පනත යටතේ වන වරදක් කිරීම සම්බන්ධයෙන් අධිචෝදනා ලබා ඇති තැනැත්තකුට එරෙහිව සාක්ෂිකරුවකු වශයෙන් සාක්ෂි ලබා ගැනීමට ප්‍රකාශය ලබා දෙන තැනැත්තා නීතිපතිවරයා විසින් කැඳවනු ලබන අවස්ථාවක දී, එකී සම්පූර්ණ ප්‍රකාශයම හෝ ඉන් කොටසක් ලකුණු කර එකී තැනැත්තා සම්බන්ධ මුල් ප්‍රශ්න කිරීමේ කොටසක් ලෙස සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(5) (අ) සැකකරු විසින් ප්‍රකාශයක් ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින් එම කරුණු අදාළ පොලිස් නිලධරයාට සන්නිවේදනය කළ යුතු ය.

(ආ) සැකකරු විසින් ප්‍රකාශයක් ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවේ දී, ඔහු රඳවා තැබීමේ නියමයක් ප්‍රකාරව රඳවා තබා සිටින්නේ නම් නැතහොත් රිමාන්ඩ් භාරයේ සිටින්නේ නම්, ඔහු, අවස්ථාවෝචිත පරිදි, රඳවා තබනු ලැබීම සඳහා හෝ රිමාන්ඩ් භාරයට ආපසු යවනු ලැබිය යුතු ය.

විමර්ශන සම්පූර්ණ කිරීම

**67.** (1) විමර්ශනය සම්පූර්ණ කරන ලද විට දී, අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්, විමර්ශනය සම්පූර්ණ කිරීම පිළිබඳ දැනුම් දෙමින් මහෙස්ත්‍රාත්වරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) විමර්ශනය සම්පූර්ණ කර ඇත්තේ යම් සැකකරුවෙක් සම්බන්ධයෙන් ද, එවැනි සැකකරුවකු සම්බන්ධයෙන් මේ පනත යටතේ රඳවා තැබීමේ නියමයක් නිකුත් කිරීම හෝ එවැනි නියමයක් දීර්ඝ කිරීම කරනු නොලැබිය යුතු ය.

(3) යම් අවස්ථාවක දී, මේ පනත යටතේ සිරභාරයට ගන්නා ලද යම් තැනැත්තෙක් සම්බන්ධයෙන් වන විමර්ශනයක් නැවත ආරම්භ කළ යුතු වන්නේ නම්, එකී වැඩිදුර විමර්ශන නැවත ආරම්භ කිරීම සහ සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයා සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දැනුවත් කරනු ලැබිය යුතු ය.

විමර්ශනවල සටහන්

**68.** විමර්ශනය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, විමර්ශන සටහන් නීතිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්

